**ශීර්ෂය 286 - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 286 - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුනි 28 දින ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1. විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබූ මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 416.82 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 412.23 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 4.59 ක් හෙවත් සියයට 1.11 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **යදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 341.46 | 339.57 | 1.89 | 0.55 |
| මූලධන | 75.36 | 72.66 | 2.70 | 3.58 |
| **එකතුව** | **416.82** | **412.23** | **4.59** | **1.11** |

**2.2.** **ආදායම් ගිණුම**

**-----------------**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

**-------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් 20.02.01.03 දරන ආදායම් සංකේතය සඳහා රු.මිලියන 45.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 19.19 ක් හෙවත් සියයට 42.64 කින් ඉක්මවා රු.මිලියන 64.19 ක් රැස්කර කර තිබුණි.

**2.3.** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**----------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**-----------------------------------------------**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 28601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| 16.00 | 15.85 | 14.00 | 15.42 | 60.00 | 52.97 |

**2.4.** **අග්‍රිම ගිණුම**

**-------------**

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0042/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 10.03 ක් විය.

**2.5.** **පොදු තැන්පත් ගිණුම්**

**-----------------------**

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 3 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු. මිලියන 70.31 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු. මිලියන** |
| 6000/0000/00/0002/0068/000 | 1.67 |
| 6000/0000/00/0016/0020/000 | 68.59 |
| 6000/0000/00/0018/0025/000 | 0.05 |
| | -------- |
| **එකතුව** | **70.31** |
| | **====** |

## 2.6. විගණන නිරීක්ෂණය

---

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---

### 3.1 විසර්ජන ගිණුම

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූලධන වැය විෂයයන් 2 කට අධිප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ක් හා සියයට 29 ක් වී තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 29 දිනැති අංක 07/2015 දරන අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 15 ක අනිවාර්ය ඉතිරි කිරීමක් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකර එම වැය විෂය සඳහා රු.1,018,103 ක ප්‍රතිපාදන පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීමක් මගින් ලබා ගෙන තිබුණි. 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව වෙන්කළ වාහන හිමි නොවන නිලධාරීන් සඳහා වාහන වෙන් කිරීම, කණ්ඩායම් ප්‍රවාහන හිමි නොවන නිලධාරීන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම හා දෛනිකව කිලෝ මීටර 100 ක දුර ප්‍රමාණය ඉක්මවා එම කණ්ඩායම් ප්‍රවාහනය ලබා දී තිබුණි. එසේම ඉහත සඳහන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 1.3 ඡේදයට පටහැනිව දෙපාර්තමේන්තුවේ සහකාර ඉඩම් කොමසාරිස් III ශ්‍රේණියේ සේවය කරන නිලධාරීන් 14 දෙනෙකුට හා නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් ලෙස වැඩ බැලීමේ පත්වීම් සිදු කර එම වැඩ බැලීමේ කාල සීමාව අවසන් කරන ලද තවත් නිලධාරීන් තිදෙනෙක් වශයෙන් නිලධාරීන් 17 දෙනෙකු සඳහා කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් ලබා දීම සඳහා 2016 ජනවාරි මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා එකතුව රු.614,033 ක් ඉන්ධන සඳහා වැය කර තිබුණි. මේ නිසා ඉන්ධන වියදම් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන ඉක්මවා තිබුණු බැවින් ඒ සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීමට සිදු වී තිබුණි.

### 3.2 ආදායම් ගිණුම

---

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් ආදායම් සංකේතයක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස් කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව ආදායම් පුරෝකථනය කිරීම හා ඇස්තමේන්තු පිළියෙල කිරීම සිදු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට හිඟහිටි ආදායම රු.23,419,394 ක් වූ අතර ඉකුත් වර්ෂය අවසාන වන විට එය රු. 22,341,669 ක් වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී හිඟහිටි ආදායම සියයට 4.82 කින් වැඩිවී තිබුණි. තවද වර්ෂ 03 කට වැඩි කාලයක සිට පැවත එමින් තිබුණු හිඟහිට ආදායම රු.4,772,202 ක් වූ අතර, වර්ෂ 1 කට වැඩි වර්ෂ 2 ක් දක්වා කාලයක සිට හිඟහිටව පැවැත එන ආදායම

රු.13,732,354 ක් වී තිබුණි. දෙපාර්තමේන්තුව විසින් එම හිඟහිටි ආදායම් එකතු කිරීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ඇ) නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාල විසින් ඉදිරිපත් කරන ලද හිඟ ආදායම් වාර්තා හා ආදායම් ගිණුමෙහි ඇතුළත් හිඟ ආදායම් වාර්තා අතර වෙනස්කම් අනාවරණය වී තිබුණත්, එම වෙනස්කම් සසදා නොතිබුණි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 5 කට අදාළ හිඟ ආදායම් හා ආදායම් ගිණුමේ ඇතුළත් හිඟ ආදායම් අතර එකතුව රු.5,147,652 ක් වෙනසක් අනාවරණය වී තිබුණි.

(ඈ) රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2016 වර්ෂයේදී රු.19,957,603 ක් වැය කර තිබුණි. 2017 ජුනි 28 දින වන විට අන්තර් පළාත් බදු ආදායම් සම්බන්ධයෙන් තොරතුරු කිසිවක් එම දත්ත පද්ධතියට ඇතුළත් කර නොතිබුණි.

(ඉ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව හිඟ බදු අයකර ගැනීමේ ඉලක්කගත තත්ත්වය සියයට 75 ක් වුවද, 2016 ජනවාරි 01 දිනට පැවැති හිඟ ආදායමෙන් සමාලෝචිත වර්ෂයේදී සියයට 17 ක් පමණක් රැස්කර තිබුණි.

**3.3 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

-----------------------------------------------------------------------

විෂය අංක 28601 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.3,048,762 ක් විය. එම හිඟහිටි ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 28 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**3.4 පොදු තැන්පත් ගිණුම්**

-----------------------

ඉදිකිරීම් සම්බන්ධයෙන් රඳවා ගන්නා ලද මුදල් අදාළ කාලපරිච්ඡේදය අවසන් වී වර්ෂ 4 ක සිට වර්ෂ 7 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණු එකතුව රු.66,210,414 ක තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි..

**3.5 වත්කම් කළමනාකරණය**

---------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

දෙපාර්තමේන්තුව සතු වාහන 02 ක් වර්ෂයකට අධික කාලයක සිටද, තවත් වාහන 02 ක් මාස 10 කට අධික කාලයක සිටද භාවිතයෙන් තොරව පැවතුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

----------------------------------------

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සියලුම දෙපාර්තමේන්තු සහ දෙපාර්තමේන්තු ශාඛාවල ඇති භාණ්ඩ පිළිබඳව සමීක්ෂණයක් කළ යුතු වුවත්, අම්පාර නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලයට අයත් උපකාර්යාල 16 ක භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) **බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

---

දෙපාර්තමේන්තුව විසින් අවිධිමත් ලෙස එක් මෝටර් වාහනයක් වර්ෂයක කාලයක සිටද, තවත් මෝටර් රථයක් මාස 6 ක කාලයක සිටද ඉඩම් අමාත්‍යාංශයේ භාවිතය සඳහා ලබා දී තිබුණි.

(ඈ) **වෙනත් ආයතන සතු වත්කම් පරිහරණය කිරීම**

---

මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අයත් එක් වාහනයක් වර්ෂ 2 කට අධික කාලයක සිටද, ඉඩම් අමාත්‍යාංශයට අයත් වාහන 2 ක් වර්ෂ 8 කට අධික කාලයක සිටද, වාහන 7 ක් වර්ෂ 2 කට අධික කාලයක සිටද දෙපාර්තමේන්තුව විසින් භාවිතා කර තිබුණු නමුත් එම වාහන විධිමත් පරිදි පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.6 බේරුම් නොකළ බැරකම්**

---

දෙපාර්තමේන්තුව විසින් 2016 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ වර්ෂයකට අඩු කාලයක සිට පැවැත එන බැරකම් රු.6,739,804 ක් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළ එකතුව රු.83,066 ක් වූ බැරකම් විසර්ජන ගිණුමේ දක්වා නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 94 ට පටහැනිව විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.2,347,232 ක බැරකම්වලට එළඹ තිබුණි.

**3.7. කාර්යසාධනය**

---

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරි සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **ප්‍රමාණවත් ලෙස ඉටු නොකල ප්‍රධාන කාර්යයන්**

---

වර්ෂය තුළ ඉටුකළ යුතුව තිබූ කාර්යයන් අතරින් ප්‍රමාණවත් පරිදි ඉටු නොකළ කාර්යයන් පිළිබඳ විස්තර පහත පරිදි විය.

(i) බිම්සවිය වැඩසටහන යටතේ බලපත්‍ර ලබාදීම, දිමනා පත්‍ර ලබාදීම, රන්බිම දීමනා පත්‍ර ලබාදීම, ත්‍රිවිධ හමුදා හා පළාත් පාලන ආයතනවලට පැවරුම් නියෝග නිකුත් කිරීම, සුනාමි දීමනාපත්‍ර ලබා දීම, ආයෝජන ව්‍යාපෘති හා යටිතල පහසුකම් සඳහා ඉඩම් ලබා දීම යන කාර්යයන්හි ඉලක්කගත තත්ත්වයට සාපේක්ෂව ප්‍රගතිය සියයට 10 ක සිට සියයට 54 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ii) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉඩම් කැබලි 1,000,000 ක තොරතුරු රැස්කර පද්ධතියට ඇතුළත් කිරීමට සැලැසුම් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානයට තොරතුරු ඇතුළත් කිරීම ඉඩම් කැබලි 498,622 ක් හෙවත් සියයට 50 කට ආසන්න ප්‍රමාණයක් වුවද, ඒ සඳහා වන මූල්‍ය ප්‍රගතිය සියයට 99 ක් වී තිබුණි.

(iii) ක්‍රියාකාරි සැලැස්මට අනුව ඉලක්කගත තත්ත්වයට ළඟාවීමට සම්පූර්ණයෙන්ම අපොහොසත් වූ ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත පරිදි විය.

| ක්‍රියාකාරකම | ළඟාවීමට අපොහොසත් වූ සම්පූර්ණ ඉලක්කගත තත්ත්වය |
|---|---|
| දීමනාපත්‍ර ඉඩම් සඳහා සින්නක්කර ඔප්පු ලබා දීම | 450,000 (ඔප්පු) |
| ඉඩම් ප්‍රදාන විශේෂ විධිවිධාන පනත යටතේ දීමනාපත්‍ර නිකුත් කිරීම | 260 (දීමනාපත්‍ර) |
| ආයෝජන ව්‍යාපෘති හා යටිතල පහසුකම් සඳහා සුදුසු ඉඩම් හඳුනා ගැනීම | 5000 (අක්කර) |
| රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලා ගැනීම පාලනය | 500 (ඉඩම් කැබලි) |
| බදු නොගෙවා ඇති බදුකරුවන් සම්බන්ධයෙන් නීත්‍යානුකූල පියවර ගැනීම සඳහා බදුකරුවන් හඳුනා ගැනීම | 20 (බදුකරුවන්) |
| බදුකර/අවසරපත්‍ර අවලංගු කිරීම | 40 (බදුකර/අවසරපත්‍ර) |

**(ආ) ළඟා කර ගත යුතු ඉලක්ක නිර්ණය කිරීම.**

කාර්යසාධනය පිළිබඳ ඉලක්කයන් නිර්ණය කිරීමේදී පසුගිය වර්ෂවල ළඟා කරගත් ඉලක්කගත තත්ත්වයන් හා ආයතනයේ ශක්‍යතාවය යන කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් අදාළ ඉලක්කයන් නිර්ණය කළ යුතුව තිබුණි. එසේ වුවද වර්ෂය තුළ ක්‍රියාත්මක වූ පහත සඳහන් බදුකර, බලපත්‍ර ලබාදීම හා දීමනා පත්‍ර ලබාදීමේ ඉලක්කගත තත්ත්වයන් පිළිවෙලින් සියයට 151 ක්, සියයට 270 ක් හා සියයට 128 ක් වශයෙන් වී තිබුණි. විස්තර පහත පරිදි විය.

| | ක්‍රියාකාරකම | ඉලක්කය | සමස්ථ ප්‍රගතිය | පසුගිය වර්ෂයේ ළඟා කරගත් ඉලක්කය | ප්‍රගතිය ඉලක්කයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| (i) | රජයේ ඉඩම් ආඥා පනත යටතේ භුක්තිය සඳහා විධිමත්ව භාරදීම. | බදුකර 2,000 | බදුකර 3,023 | බදුකර 3,509 | බදුකර 151 |
| (ii) | දීර්ඝකාලීන බලපත්‍ර ලබාදීම | බලපත්‍ර 1,800 | බලපත්‍ර 4,863 | බලපත්‍ර 4,290 | බලපත්‍ර 270 |
| (iii) | පූජා භූමි දීමනාපත්‍ර ලබාදීම | දිමනා පත්‍ර 40 | දීමනා පත්‍ර 51 | දීමනා පත්‍ර 62 | දීමනා පත්‍ර 128 |

## 3.8. අධිකාර බලය නොමැති ගනුදෙනු

-----------------------------------

දෙපාර්තමේන්තුවේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අධිකාරී බලය නොලත් ගනුදෙනු අනාවරණය විය.

(අ) ඉඩම් කොමසාරිස් (නීති) තනතුරේ වැඩ බැලීම සඳහා පත් කිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනිමෙන් තොරව දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි 2014 ජුනි 20 දින සිට ඉඩම් කොමසාරිස් (නීති) තනතුරේ වැඩ බැලීම සඳහාද, ඉන් අනතුරුව 2016 ජනවාරි 13 දින සිට ඉඩම් කොමසාරිස් (නීති) තනතුරේ පූර්ණකාලීනව රාජකාරී ඉටු කිරීම සඳහා ද අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පත්කර තිබුණි.

(ii) එසේ වුවද, ඉඩම් කොමසාරිස් (නීති) තනතුර සඳහා වූ බඳවා ගැනීම් පටිපාටිය 2017 ජූලි 01 දින වන විටත් අනුමත කර නොතිබුණි. එසේ තිබියදී 2014 ජූලි 14 දින සිට නීති නිලධාරීට තනතුරට අදාළ නිල වාහනය ලෙස වාහනයක් වෙන් කර තිබුණු අතර ඩීසල් ලීටර් 140 ක් වෙන් කර මසකට රු.13,300 ක ඉන්ධන දීමනාවක් ගෙවා තිබුණි. එසේම 2016 ජූලි 01 වන දින නීති නිලධාරි විශ්‍රාම ගෙන තිබුණු අතර විශ්‍රාම ගැනීමෙන් පසුවද මාසයක කාලයක් වෙන්කළ වාහනය භාවිතා කර තිබුණි.

(iii) විශ්‍රාම ගැනීමෙන් අනතුරුව මෙම නිලධාරියාට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2007 හි විධිවිධාන පරිදි 2016 ජූලි 01 දින සිට මාස 6 ක කාලසීමාවක් සඳහා කොන්ත්‍රාත් පදනම මත නීති නිලධාරි තනතුරේ සේවයේ යෙදවීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී තිබුණි. නමුත් චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය මත කෑගල්ල නිවසේ සිට දිනපතා රාජකාරියට යාම් ඒම් සඳහා 2016 ජූලි මාසයේ සිට සංචිත වාහනයක් ලබා දී තිබුණි. මේ අනුව කොන්ත්‍රාත් කාලසීමාව තුළදී නිවසට යාම් ඒම් සඳහා රු.96,552 ක් ඉන්ධන සඳහා වැය කර තිබුණි.

(ආ) ඉඩම් පිළිබඳ කළමනාකරණ පද්ධතියට තොරතුරු ඇතුළත් කිරීමේ වැඩමුළුවලට සහභාගී වන දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් බාහිර සම්පත් දායකයින් සඳහා පමණක් සම්පත් දායක දීමනා ගෙවීමට අනුමැතිය ලබා දී තිබුණි. නමුත් දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර නිලධාරීන් විසින් රාජකාරී වේලාව තුළ සිදුකරන ලද පුහුණු පාඨමාලාවලට සහභාගී වීම වෙනුවෙන් 2016 වර්ෂයේදී නිලධාරින් දෙදෙනෙක් සඳහා රු.82,900 ක සම්පත් දායක දීමනා ගෙවා තිබුණි.

## 3.9. පාඩු හා හානි

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ හෙක්ටයාර් 0.1352 ක්, පර්චස් 20 ක හා පර්චස් 10 ක රජයේ ඉඩම් තුනක, ආයතන 03 ක් විසින් රජයේ අවසරයකින් තොරව 2005, 2008 හා 2011 වර්ෂවලදී සම්ප්‍රේක්ෂණ කුළුණු 03 ක් ඉදිකර සම්ප්‍රේක්ෂණ කටයුතු පවත්වා ගෙන යමින් තිබුණු අතර, එම ආයතනවලින් රජයට ලැබිය යුතු බදු ආදායම් අයකර ගෙන නොතිබුණි.

(ආ) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පවතින රජයේ ඉඩම්වල අනවසර පදිංචිවීම් හා ඉදිකිරීම් පිළිබඳව වාර්ෂිකව ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත වාර්තා කෙරෙන අයුරින් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව සතු වාහනයකට සමාලෝචිත වර්ෂයට, වර්ෂ 15 කට පෙර සිදු වූ අනතුරකින් වූ අලාභහානිය අදාළ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හෝ පොතෙන් කපා හැරීමට හෝ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

## 3.10 අනාර්ථික ගනුදෙනු

---------------------

ඉඩම් තොරතුරු පද්ධතියට, තොරතුරු ඇතුළත් කිරීම සඳහා නිලධාරීන් පුහුණු කිරීමේ කාර්යය දෙපාර්තමේන්තුව විසින් සිදු කර තිබුණි. එම පුහුණුවීම් කටයුතු සඳහා 2015 දෙසැම්බර් මාසයේදී රත්මලානේ පිහිටි ලෝක ආහාර ගබඩාව, පරිගණක විද්‍යාගාරයක් ලෙස සකස් කිරීමේ කටයුතු අවසන් කර තිබුණි. එසේ වුවද, එම ගොඩනැගිල්ල පුහුණු කටයුතු පැවැත්විය හැකි පරිදි සකස් කිරීම හා වැසිකිළි සකස් කිරීම සඳහා 2016 වර්ෂයේදී තවත් මාස 09 කට අධික කාලයක් ගත කර තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාළ පුහුණු පාඨමාලා පැවැත්වීමේ කටයුතු එම ගොඩනැගිල්ලේ සිදු කළ නොහැකි වීම නිසා වෙනත් පුහුණු මධ්‍යස්ථානයක් කුලියට ලබා ගෙන තිබුණි. දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා රු.මිලියන 3.84 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ආහාර ගබඩාව පරිගණක විද්‍යාගාරයක් ලෙස සකස් කිරීම සඳහා ලංසු කැඳවා තිබුණි. ඒ අනුව ලංසුකරුවන් පස්දෙනෙකු ඉදිරිපත් වී තිබුණු අතර, ඉන් අවම ලංසුව වූ රු.2,594,890 කට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. එම පරිගණක විද්‍යාගාරයේ නවීකරණයට හා වැසිකිලි පද්ධතිය ඉදිකිරීම සඳහා අවස්ථා දෙකකදී ලංසු කැඳවා තිබුණු අතර, එම කාර්යයන් දෙකම එකම කොන්ත්‍රාත්කරුවෙකු වෙත පිළිවෙලින් රු.1,659,340 කට හා රු.2,018,833 කට කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආහාර ගබඩාව පරිගණක විද්‍යාගාරයක් කිරීම එකම කොන්ත්‍රාත්තුවක් ලෙස සලකා ලංසු කැඳවීම සිදු කර නොතිබුණු බැවින් එය කොටස් කර ලංසු කැඳවීම නිසා කොන්ත්‍රාත්තුවේ පිරිවැය අවම කර ගැනීමට තිබුණු අවස්ථාව සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ අවධානය යොමු කර නොතිබුණි.

(ii) කල්තියා හඳුනාගෙන ඇස්තමේන්තුවට ඇතුළත් කළ හැකිව තිබුණු වැසිකිළි පද්ධතියට ජල ටැංකියක් සවිකිරීම හා ඉනිමඟක් ඉදිකිරීම යන කාර්යයන් අතිරේක කාර්යයක් ලෙස සලකා රු.71,500 ක අතිරේක ඇස්තමේන්තු අනුමත කර ගෙවීම් කර තිබුණි.

(iii) පරිගණක විද්‍යාගාරයෙහි වායු සමීකරණ යන්ත්‍ර 3 ක් එකලා විදුලි සම්බන්ධතාවයකින් ක්‍රියා කළ නොහැකි බව ඇස්තමේන්තු පිළියෙල කිරීමට පෙර හඳුනාගෙන නොතිබුණි. අදාළ කාර්යය ඉටුකිරීම ආරම්භ කිරීමෙන් පසු රු.258,235 ක අතිරේක ඇස්තමේන්තුවක් පිළියෙල කර ගෙවීම් කර තිබුණි. ඊට අමතරව තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශයකින් තොරව Split type 60000 BTU වායු සමීකරණ යන්ත්‍ර 03 ක් වෙනුවට Split type 24000 BTU වායු සමීකරණ යන්ත්‍ර 07 ක් සවිකිරීමටද කටයුතු කර තිබුණි.

(iv) ඇළුමීනියම් මගින් කාමර වෙන්කිරීමද සිදු කළ යුතු ආකාරය පිළිබඳව පූර්ව සැලසුම් කිරීමක් කර නොතිබීම නිසා රු.147,825 ක අතිරේක වැයක් සිදු කර තිබුණි.

(v) කොන්ත්‍රාත්කරුවන් සමඟ එළඹ තිබුණු ගිවිසුම්වල දිනක ප්‍රමාද ගාස්තු මුදල ලෙස ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන ආයතනයේ SBD 1 ට වඩා අඩු වූ ප්‍රමාණයක් දක්වා තිබුණි. මේ නිසා රු.51,749 ක ප්‍රමාද ගාස්තු අඩුවෙන් අයකර ගෙන තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් මාසයේදී මිලදී ගන්නා ලද එකතුව රු.1,558,440 ක් වූ මුද්‍රණ යන්ත්‍ර 15 ක් මිලදී ගෙන තිබුණි. ඉන් යන්ත්‍ර 9 ක් 2016 අගෝස්තු 15 දින වන විටත් අවශ්‍යතාවය හඳුනාගෙන අදාළ අංශ වෙත නිකුත් කිරීමෙන් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

(ඇ) පරිගණක විද්‍යාගාරයේ අවශ්‍යතා වෙනුවෙන් 2015 දෙසැම්බර් මාසයේදී මිලදී ගන්නා ලද යූ.පී.එස්. 98 කින් 48 ක් පමණක් 2016 ඔක්තෝබර් 07 දින වන විටත් බෙදා හැර තිබුණි. එකතුව රු.215,200 ක් වටිනා ඉතිරි යූ.පී.එස්. 50 ක සංඛ්‍යාවක් රත්මලාන පරිගණක විද්‍යාගාරය සඳහා වෙන් කර තිබෙන බව සඳහන් කර තිබුණත්, 2016 දෙසැම්බර් 31 දින වන විටත් පරිගණක විද්‍යාගාරයෙහි පුහුණුවීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඈ) 2015 ඔක්තෝබර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාල සීමාව තුළ මිලදී ගෙන තිබූ එකතුව රු.3,556,100 ක් වටිනා පරිගණක 43 ක් 2016 අගෝස්තු 15 දින වන විටත් ගබඩාවේ නිෂ්ක්‍රීයව පැවතුණි. තවද පරිගණක විද්‍යාගාරය වෙනුවෙන් මිලදී ගෙන තිබූ මෙම පරිගණක, විද්‍යාගාරයේ කටයුතු 2017 ජූනි 30 දින වන විටත් ආරම්භ නොකිරීම නිසා පරිගණකවල වගකීම් කාලය පූර්ණ වශයෙන් ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි.

(ඉ) 2015 නොවැම්බර් මාසයේදි මිලදි ගත් පරිගණක මේස 45 කින් මේස 30 ක් ඉතිරිව තිබියදී, නැවතත් 2016 ජූනි හා අගෝස්තු මාසවලදි මේස 34 ක් මිලදී ගෙන තිබුණි. මෙම රු.779,338 ක් වටිනා පරිගණක මේස 64 ක් පරිගණක විද්‍යාගාරයේ කටයුතු ආරම්භ නොකිරීම නිසා 2016 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඊ) 2015 දෙසැම්බර් මාසයේදි මිලදි ගන්නා ලද පරිගණක පුටු 54 කින් පුටු 31 ක් භාවිතයට ගෙන නොතිබියදී, 2016 අප්‍රේල් මාසයේ දී තවත් පුටු 56 ක් මිලදී ගෙන තිබුණි. අවස්ථා දෙකකදී මිලදී ගෙන තිබූ රු.670,665 ක් වටිනා පුටු 87 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිෂ්ක්‍රීයව පැවතුණි.

## 3.11 කළමනාකරණ දුර්වලතා

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ඉඩම් දීර්ඝකාලීන බදු පදනම මත ලබාදීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු තෝරාගත් ආයෝජකයින් වෙත භුක්තිය සඳහා ඉඩම් පැවරීමක් කර තිබුණි. ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ උපදෙස් මත ඉඩම් භුක්තිය සඳහා භාරදුන් දිනයේ පැවති තක්සේරු වටිනාකම මත ගෙවිය යුතු බදු මුදල ආයෝජකයින් වෙත දැනුම් දීම සිදු කළ යුතුව තිබුණි. එසේ භුක්තිය සඳහා භාර දුන් දිනයේ සිට ගෙවිය යුතු බදු මුදල පිළිබඳව ආයතන 6 ක් වෙත දැනුම් දීමට වර්ෂ 5 ක සිට වර්ෂ 9 ක් දක්වා කාල පරාසයක් ගත කර තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් රජයේ ඉඩම්, ආයෝජකයන් වෙත දීර්ඝකාලීන බදුදීම 1999 වර්ෂයේදී ආරම්භ කර අදියර 2 ක් යටතේ ක්‍රියාත්මක කර තිබුණි. 2013 දෙසැම්බර් 13 දිනැති අංක 2013/08 දරන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර චක්‍රලේඛය ප්‍රකාරව එම ආයෝජකයන් දිරිමත් කිරීම සඳහා කර්මාන්තපුරවල හා කාර්මික ජනපදවල ආයෝජකයින් විසින් 2011 ජූනි 01 දින දක්වා නොගෙවා හිඟව පැවති බදු මුදල කපා හැර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී තෝරාගන්නා ලද ආයෝජකයින් 11 දෙනෙකුගේ 2011 ජූනි 01 දින සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා කාල පරාසයක සිට හිඟ බදු මුදල රු.39,907,658 ක් වී තිබුණි. එම හිඟහිටි බදු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රත්මලාන කර්මාන්තපුරයේ ආයෝජකයින් සඳහා ලබා දී තිබූ ඉඩම්වල ගොඩනැගිලි 2 ක් හා දොඹකරයක් සහිත අනුෂාංගික උපාංග සහිත ගොඩනැගිල්ලක් පැවැතුණි. එහි තක්සේරු වටිනාකම රු.21,584,802 ක් වී තිබුණි. එම ඉඩම ලබාදී වර්ෂ 10 ක සිට වර්ෂ 17 ක් දක්වා වූ කාලයක් ගත වී තිබුණද, අදාළ බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හෙක්ටයාර් 2.503 ක රජයේ ඉඩම් කොටසක රාජ්‍ය සංස්ථාවක් ස්ථාපනය කර තිබුණි. 2011 දෙසැම්බර් 21 දින එම ඉඩමට නීත්‍යානුකූල හිමිකමක් ලබාදීම සඳහා වර්ෂ 30 ක කාලයකට අදාළව බදු අයකර ගැනීමට බස්නාහිර පළාත් අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණි. ඒ අනුව රජයේ ඉඩම් ආඥා පනතේ විධි විධාන ප්‍රකාරව සිදු කරන ලද ගණනය කිරීම් අනුව 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළ මුළු බදු මුදල රු.මිලියන 1,019.20 ක් වී තිබුණත්, එම හිඟ බදු මුදල් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.12 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 53 | 38 | 15 |
| (ii) | තෘතියික මට්ටම | 38 | 09 | 29 |
| (iii) | ද්විතියික මට්ටම | 674 | 390 | 284 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 140 | 110 | 30 |
| | **එකතුව** | **905** | **547** | **358** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

දෙපාර්තමේන්තුවේ සමාජ විද්‍යාඥ තනතුරට අදාළ රැකියා විස්තරය අනුව ජනපදිකයින් පදිංචි කිරීම හා පහසුකම් සැපයීම, මානව සම්බන්ධතා විද්‍යානුකූලව සැලැසුම් කිරීම, උස්බිම් සංවර්ධන ව්‍යාපෘතියට අදාළ පසු විපරම් කටයුතු කිරීම, වාර්තා කිරීම හා සමාජ ආර්ථික සමීක්ෂණ පැවැත්වීම මඟින් පැන නගින ගැටලු නිරාකරණය කිරීම ඉටු කළ යුතුය. එම තනතුරට අදාළ කිසිදු කාර්යයක් වර්තමානයේදී ඉටු නොවන බව නිරීක්ෂණය විය. ඒ අනුව සමාජ විද්‍යාඥ තනතුරක් ඇති කිරීම තුළින් බලාපොරොත්තු වූ මූලික අරමුණ ඉටු වී නොතිබුණි.